**IPRC/16/118**

# ශුන්‍යතා සංකල්පය බිහිවීමෙහිලා විෂයාගත වූ මූලික සූත්‍රාගත මූල බීජ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පියුමි දිසානායක*

මහායාන සම්ප්‍රදායේ ආරම්භක නිකාය ලෙස මධ්‍යමක ගුරුකුලය හැඳින්විය හැකි ය. මෙම සම්ප්‍රදාය බිහිවීම සඳහා මහාසාංඝික සම්ප්‍රදායේ ඉගැන්වීම් මූලබීජ වූ බව කිව හැකි ය. එහෙත් මහායානය දර්ශනයක් ලෙසට ක්‍රි.පූ. 01 වන සියවස වනවිට ඉදිරිපත් කිරීමේ ගෞරවය හිමිවන්නේ ආර්ය නාගර්ජුන පාදයන්ට ය. එතුමා එකල පැවති ආත්මවාදය ඛණ්ඩනය කිරීමට බෞද්ධ අනාත්ම දර්ශනය දෙසට නොහැරී සාපේක්ෂකවාදයෙ හි ඉගැන්වෙන ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කර ගත්තේය. එබැවින් බෞද්ධ දර්ශන සම්ප්‍රදායන් අතර මධ්‍යමක දර්ශනය නමින් දැක්වෙන්නේ ප්‍රතීත්‍යසමුත්පාදය පදනම් කර ගත් සාපේක්ෂකවාදය යි. නාගර්ජුනපාදයන් මධ්‍යමක දර්ශනය ගොඩනගන්නේ බුද්ධ දේශිත ප්‍රතීත්‍යසමුත්පාදයෙනි. මේ අනුව සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය විවරණය කිරීමේ දී ස්ථවිරවාදීන්ගේ හා ආභිධම්මිකයන්ගේ විවරණය අනුව බලන විට පැරණි බුදු සමය පුද්ගල නෛරාත්ම්‍යවාදයක් හා ධර්ම අනිත්‍යත්ව වාදයක් ලෙස සංක්ෂිප්ත ව දැක්විය හැකිය. එහෙත් මේ අයුරින් ධර්ම විවරණය කිරීමේ දී බුද්ධ මතය ඉදිරිපත් නොවන බව සැලකූ මධ්‍යමකයෝ "ශූන්‍ය" යන වචනයට අවධානය යොමු කළහ. සත් - අසත් යන ශාස්වත, උච්ඡේද අන්තවලට නොවැටී බුද්ධ වචනය ව්‍යාඛ්‍යාන කරන්නට විය. ඔවුහු නිරන්තරයෙන් සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය හේතුඵල සම්බන්ධය, සංසාරය, දුක ආදී නිවනින් මෙපිට ඇති කවර කරුණක් වුව ද ඔවුහු පටිච්චසමුප්පාදයට අනුගතව ම විග්‍රහ කරති. මධ්‍යමක දර්ශනයට අනුව ශූන්‍යතාව ලෝකෝත්තර සත්තාවක් නොවේ. ශූන්‍යතා සංකල්පය වුව ද පැනෙන්නේ ශූන්‍යතා අර්ථයෙනි. ශූන්‍යතා සංකල්පයෙන් අපේක්ෂිත අරමුණු වන්නේ, ධර්ම නෛරාත්මතාව,පරස්පරාපේක්ෂිත බව ප්‍රකට කිරීම ය. මෙකී සංකල්පය ප්‍රභවය වීම ආකස්මිකව සිදු වූවක් නොවේ. බුදුන් වහන්සේ ජීවමාන සමයේ දී ම මේ සඳහා පසුබිම සකස් කර ඇති දැයි අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මූලික සූත්‍ර දේශනා පදනම් කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කිරීමට අපේක්ෂා කෙරෙයි.

***ප්‍රමුඛ පද - ශූන්‍යතාව, ප්‍රතීත්‍යසමුත්පාදය නාගර්ජුන පාදයන්, මධ්‍යමක දර්ශනය, මුල් බුදුදහම***

* piumidissanayaka88@gmail.com